# විදේශ කටයුතු අමාත්‍යාංශය

# ව්‍යාපෘති නිලධාරීන්
# කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට 2017.04.15 දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

රැකියා විස්තරය :

එක්සත් ජාතීන්ගේ සංවිධානය, පොදු රාජ්‍ය මණ්ඩලය හා වෙනත් අදාළ සංවිධානවලට ඇති ගිවිසුම්ගත බැඳීම්වලට අනුව, නිසි වේලාවට වාර්තා කිරීම හා වගකීම් ඉටුකිරීමට අදල කටයුතු, ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම, විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාව ස්වේච්ඡාවෙන් ඉටුකරන වගකීම්වලට අදළ දත්ත එක්රැස් කිරීම හා සංසන්දනය කිරීම.

අදල සුදුසුකම් :

1. අධ්‍යාපන : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ව්‍යාපෘති කළමනාකරණය, ජාත්‍යන්තර සබඳතා හෝ රැකියා විස්තරයට අදළ වෙනත් ක්ෂේත්‍රයක් පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම
2. පළපුරුද්ද : රැකියා විස්තරයට අදළ ක්ෂේත්‍රයක වසර 2 සිට 5 දක්වා වූ පළපුරුද්ද
3. භාෂා ප්‍රවීණතාවය : රාජකාරී ඉටු කිරීමේ භාෂාව වශයෙන් මෙම තනතුර සඳහා ඉංග්‍රීසි භාෂාව දක්ෂ ලෙස හැසිරවීමේ හැකියාව
4. වෙනත් : ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම

වයස් සීමාව : අවුරුදු 30 ට අඩු

වැටුප් පරිමාණය : ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව සාකච්ඡා කිරීමෙන් තීරණය කරනු ලැබේ.

බඳවා ගැනීමේ පටිපාටිය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

ඉහත තනතුර සඳහා උනන්දුවක් දක්වන අයදුම්කරුවන්, සිය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳව සඳහන් කරමින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කරන ලද අයදුම්පතක් මෙම තනතුර සඳහා අයදුම් කරන හේතුව, රැකියා විස්තරයේ සඳහන් ක්ෂේත්‍රයන්ට තම කුසලතා සහ අත්දැකීම්වල අදාළභාවය වචන 500 ට නොවැඩි සංඛ්‍යාවකින් සඳහන් කරමින් ආවරණ ලිපියක්, අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත් සමග 2017.05.05 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය පැහැදිලිව සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**විදේශ කටයුතු අමාත්‍යාංශය,**
**2017.04.17**